

# ගුරුමාතාවකගේ ඕස්ට්‍රේලියානු සංචාරය

තිලකාවතී ජයවික්‍රම

පෙරදිග මුතු ඇටයයයි විරුදාවලිය ලද සිරිලක් මව්නි, බුදු පා පහසින් පිවිතුරු වු ඔබ වෙත මගේ ශිර්ෂ ප්‍රණාමය පළමුව පුද කරමි. මගේ වාසභූමිය වූ සිරිලක සිට මා දිවියේ පළමුවරට ඕස්ට්‍රේලියාවේ සංචාරය සඳහා භාග්‍යය උදාවුයේ මගේ අදරැති එකම දියණිය සහ දයාබර බෑණනුවන් ඔවුන්ගේ ජීවන ගමන යාම සඳහා ඕස්ට්‍රේලියාවට සැපත් වු බැවිනි.

මීට වසර කීපයකට පෙර ශ්‍රී ලංකා රජයේ උසස් නිලතල හොබවමින් සිටි මා අදරැති දියණිය ඇගේ දයාබර සැමියාද සමග ඔවුන්ගේ සොදුරු මව්බිමෙන් සැතපුම් දහස් ගණනක් ඈත් වු ඔවුන්ට නුහුරු නුපුරුදු රටක සිය දිවි පෙවත ගෙනයාමට අදිටන් කිරිම ගැන එදා මා තුල ඇතිවුයේ බලවත් සෝ දුකකි. එදා සිරිලක කොලොම් පුරවරයේ සොදුරු නිවහනක දිවි ගෙවු ඔවුහු වසර කිපයක් ඇවෑමෙන් ඔවුන්ගේ අභිලාශය පරිදි ඒ සොඳුරු ලක්මවගෙන් සමුගැනීම සඳහා ගුවන් තොටුපල වෙත යනවිට මමද ඔවුනතර සිටියෙමි.

මව්සෙනෙහස හදවත පුරා කැටිකොට සිටින නිසාවෙන් දු දරුවැන්ගේ වෙන්වීම දරාගත නොහැකි විය. ඒ මොහොතේ මා නෙතින් රූරා වැටුණු කඳුළු දහරා-වන්ගෙන් මගේ ලය තෙත්විණි. එය දුටු මා දෝනී මා දෙස ශෝකාන්විතව බැල්මක් හෙලා සැනසුම් වදන් පවසා ගුවන් යානයට පිවිසිම සඳහා ඇගේ දයාබර සැමියාද සමග මගෙන් ඈත්ව යනු මට පෙණනි. ඒ අනුවේදනීය කතා පුවත මෙතෙකින් නිමා කරමි.

ඔවුන් ඕස්ට්‍රේලියාවට පැමිණ වසර කීපයකට පසු ඔවුන්ගේ දිවිපෙවෙත ගෙනයන අයුරු දැක ගැනීමේ රිසිය මටද ඇතිවිය. ඒ අනුව හයමසකට නොවැඩි කලක් ඕස්ට්‍රේලියාවේ ගතකිරිම සඳහා මෙම වසර මුල් භාගයේදී මම සහ මගේ දයාබර බෑණනුවන්ගේ මවද මෙම අපුරු දේශය බලා ගුවනින් පියාසර කලෙමු. ඉතා දිගු ගමනක් ගෙවා මෙල්බන් ගුවන් තොටුපල වෙත ලඟා වු අපි එතැන් සිට මෝටරියකින් ගමන් ඇරඹිමු. සුළු වේලාවකින් වික්ටෝරියා ප්‍රාන්තයේ මෙල්බන් පුරවරයෙහි සුන්දර පරිසරයක ඉතා අලංකාර ලෙස තැනු ඔවුන්ගේ මනරම් නිවහන දුටු අපට ඇතිවුයේ ඉමහත් ප්‍රීතියකි. දුටු දුටවන් මන බඳිනා ඒ නිවස ඔවුන්ගේ සැලසුමකට අනුව ඉදිකල බැව් අපි දැනගතිමු.

පශ්චාත් උපාධිධාරිනියක් වු මා දියණිය ඕස්ට්‍රේලියානු රජයේ උසස් රැකියාවක නිරතවනු දැකීම මට මහත් සතුටක් විය. එමෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රතිභා පූර්ණ රංගන ශිල්පියකු ද මානව හිතවාදී අපුරු මිනිසකු ද වන මා දයාබර බෑණනුවන් සිය රැකියාවට අමතරව මෙල්බන් පුර-වයේ ජනාදරය දිනා ගනිමින් සන්නස පුවත්පතට දයක වෙමින්ද එම පුවත්පතෙහි සාරවත් ලිපි පළකිරිමටත්, පුවත්පත් සාකච්ඡා පැවැත්වීමෙන් ද කරනු ලබන අමිල වු සමාජ සේවය ඉතා අගනේය.

ලක්මව හැරද මෙහි සැපත් වුණා ඔවුන්ගේ මිතුරු මිතුරියන් දැකීමත්, හෙළ සිරිතට අනුව දුක සැප බෙදාගනිමින් ඔවුන් සමග සුහදව දිවි ගෙවන අයුරු දැකීමත් මා හදතුල උපන් ශෝකය පහවී යාමට හේතුවිය. ඔවුන් මෙහි හුදකලා වී නැති බැව් අපට දැනුණි.

තිස්තුන් වරසක ගුරු දිවියේ මතක සුවඳ තාමත් රැඳී ඇති මට එදා භූගෝල විද්‍යාව හැදෑරීමේදී මා උගත් කරුණු බිඳක් මගේ මතකය අවදි කරයි.

ඕස්ට්‍රේලියාව සොයා ගැනිමේ ගෞරවය කැප්ටන් කුක් නම් දේශගවේෂකයාට හිමිවෙයි. විශ්වයේ පිහිටි මහාද්වීප අතුරින් ඉතා කුඩා මහද්වීපයද වෙයි. පැසිපික් කලාපීය රටක් වු මෙහි සමශිතෝෂ්ණ දේශගුණයක් පවතී. වසරකට එක්වරක් කොල හැලෙන වෘක්ෂලතා ද මෙහි විශේෂ ලක්ෂනයකි. ඕස්ට්‍රේලියාවේ ස්වභාවික කඳුවැටි, මාරේඩාලිං නදී , රන් ආකාර ඈ ස්වභාවිකව සම්පත් ද, සමහර විටෙක ලැව්ගිනි වැනි ස්වභාවික විපත් ද ඇතිවෙයි.

සත්ව පාලනය , කිරිපට්ටි, කිරි ආහාර , බැටලු ලොම් ඇඳුම් ආදී කරුණු මා මෙහි පැමිණිමට පෙරද දැන සිටියෙමි. එහෙත් ඒවා සියැසින් දැකගැනීමට හා ඒ පිළිබඳව අත්දැකිම් ලබාගැනිමට මගේ සංචාරය බෙහෙවින් ඉවහල් විය.

කැන්ගරු දේශය යන අන්වර්ථ නාමයෙ-න් හැඳින්වෙන ඕස්ට්‍රේලියාවේ සත්‍ය වශයෙන්ම කැන්ගරුවන්ගේ පාරාදීසයකි. ඔවුන් තණපිට්වල ඈතමෑත දුවපනිමින් කෙලිදොලෙන් හැසිරෙන දසුන් අති සුන්දරය. වර්තමාන ලෝකයේ සංවර්ධිත රටවල් අතරින් අගතැන් හිමිවන මෙරට නවීන සැප පහසුකම් වලින් අනුනවු දේශයක් බැව් මට පෙනුණි .

ඕස්ට්‍රේලියාව කාර්මික රටක් වුවත් එයට සමගාමීව කෘෂිකාර්මික දියුණුවක්ද මෙහි දක්නට ඇත. තැන තැන පිහටි ගොවිබිම් මෙන්ම අක්කර සියගණන් ඈතට දිවෙන මිදි වතු හා ඇපල් වතු ද අපි දිටිමු. යුරෝපීය සංස්කෘතියට හා සභ්‍යත්වයට අනුව හැඩ ගැසුණු ජනයාගෙන් සැදුම්ලත් මෙම දේශය බහු සංස්කෘතික රටකි. නා නා දේශවලින් සංක්‍රමණය වී මෙරට වාසභූමි කරගත් ජනතාව මෙහි සිංහල ජන කොටස් සමග සුහදව දිවි ගෙවන අයුරු අපට දක්නට ලැබුණි.
ඉතා උසස් ගණයේ තාක්ෂණික මෙවලම් වලින් පරිපුර්ණ වු ඕස්ට්‍රේලියාව තැන තැන දිස්වන නා නා පැහැති මල්ගොමු වලින් අලංකාරණය වී ඇත. මෙහි පරිසරය ඉතා සුන්දරය. දැකුම්කලුය. අධිවේගී මාර්ග හා අධිවේගී දුම්රියද ඉතා විශාල වෙළඳහල් හා ආපන ශාලාද දක්නට ඇත.

මෙල්බන් පුරවරයේ විහාරස්ථාන කීපයක් නැරඹීම සඳහා අපි සංචාරය කළෙමු. මෙල්බන්වාසී බෞද්ධ ජනතාවගේ මුදුන් මල්කඩක් වැනි එහි ලාංකීක භික්ෂුන් වහන්සේලා වැඩ වසමින් බොදු ජනතාවට කරන අමිල සේවාව සියැසින් දුටුවෙමු. පොහෝ දිනයන් හි දාන සිල භාවනා ආදි වැඩසටහන් මෙහෙයමින් බෝධි පූජා හා බෞද්ධ වත් පිළිවෙත් සපුරාලමින් ද බෞද්ධාගමේ පුනර්ජීවය ඇති කිරිම සඳහා වෙහෙසෙන අයුරු ඉතා අගනේය. ඒ අතර භාවනා නුයෝගීව වැඩවසන සුදු ජාතික තෙරුන් වහන්සේලාගේ ආරාමයක් වෙත ද අපි සංචාරය කළෙමු. වෝබටන් නැමැති ඉතා ශාන්ත පරිසරයක පිහිටි ආරමවාසී තෙරුන් වහන්සේලා සඳහා දහවල දානයද රැගෙන ගමන් කළ අපට එම තෙරණුවන්ගේ සුපේෂල ශික්ෂාකාමී බවත් බොදු දහම මැනවින් අවබෝධ කරගෙන සසර දුකින් එතෙරවීම සඳහා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය මෙනෙහි කරමින් භාවනා වඩන බවක් දක්නට ලැබුණි. කර්මය හා පුනර්භවය ගැන නායක තෙරුන් වහන්සේ දෙසූ දහම් පාඨ ඇසුවන් සිත් පහන්වීමට හේතුවිය. නිතැතින්ම ධර්මානුකූලව දිවිගෙවන තෙරණුවන්ට දන් සැපයීමෙන් ලබාගත හැකි පුණ්‍ය සම්පත්තිය අපමණය. නැවත දිනක ඩැන්ඩිනොන් ප්‍රදේශයේ පැවති කුරුලු උයනක සිරි නැරඹීම සඳහා එහි ගමන් කළෙමු. වනයෙන් ගැවසිගත් මග දෙපස රූස්ස වෘක්ෂලතාවන්ය. ස්වාභාවික සෞන්දර්යයෙන් අනූන වූ එහි නා නා පැහැති සියොතුන් තුරුලතා මැදින් බිමට පැන සංචාරකයන්ගේ සිරුරෙහි වසා ඔවුනගේ අත්වල ඇති ආහාර බුදින අයුරු විස්මය ජනක වූවා සේම මනස්කාන්ත දර්ශනයක් ද විය. සිරිලක දක්නට නොලැබෙන කුරුලු වර්ග දුටු අපට ඇති වූ දොම්නස අපමණය. නිලට නිලේ අහස සොයා ගිය රූස්ස තුරුවදු අතර සැඟවුණු කුරුළු කිචිබිචිය දෙසවන් පිනවයි. අත්තෙන් අත්තට පනිමින් මිහිරි හඬින් නටා ගයන කුරුළු රැගුම් බෙහෙවින්ම ආශ්වාද ජනකය. සුළු වේලාවක් එහි ගතකළ අපි නිවෙස් බලා ගමන් ගතිමු.
වික්ටෝරියා ප්‍රාන්තයේ බොහෝ දුර බැහැර පෙදෙසක මුහුදු වෙරළ ඉතා දීර්ඝ වූ සංචාරයක යෙදීමේ භාග්‍යයද අපට ලැබුණි. ග්‍රේට් ඕෂන් රෝඩ් නමින් හඳුන්වන ලබන මෙම මාර්ගයේ මුහුදට ඉතා ආසන්නයේ ගමන් කරනවිට, සිරිලක මුහුණු වෙරළකදී දක්නට නොලැබෙන මනස්කාන්ත දර්ශන පෙලක් අපිට දැක ගනිමට හැකිවිය. මහ සයුරෙහි වෙරළට ලංවී පිහිටා ඇති ශෛලමය කුළුණුද, මහසයුර සිපගෙන එන රළ පෙලින් ඒ කුළුණු තෙමීයන අයුරු ද අප නෙත ගැටුනි. ඒ දළ රළ පෙළ මනහර ලාලිත්‍යයෙන් යුතුව වෙරළ සිපගන්නා අයුරු චමත්කාරජනකය. නිතර හමන සිසිල් මඳ පවනින් අප ගතසිත පබුදුවන්නට විය. සිසිල් සුළඟෙහි පහස ලබමින් මුහුදු වෙරළෙහි මඳ වේලාවක් ගතකල අපට මුහුදු ගමනක් නැවත ගමන් කිරිමේ භාග්‍යයද උදාවිය. මින්පෙර එවැනි අත්දැකීමක් නොලැබු එම සංචාරය අතිශයින්ම ආශ්වාදජනක විය. ඒ අපුරු සංචාරය අමතක නොවන සිදුවීමකි. මුහුදු රළ පෙලින් ඔපවත් වු ගම්මානයක්ද අපි නැරඹුවෙමු. මෙම සංචාරයේදී මුහුදු වෙරළෙහි සිරි නරඹන්නටත් හිමිදිරි උදෑසන පිනි විසිරුණු තණපලසේ පහස ලබන්නටත් මල් ගෙඩි පිරුණ ගහකොළ පිසගෙන එන නැවුම් සුළගක පහස විදින්නටත් අපට හැකිවිය.
අපගේ ඊළඟ සංචාරය වුයේ රූස්ස තුරු මුදනට උඩින් සැදුනු කම්බි පාලමක ගමනකි. ට්‍රී ටෝප් වෝක් නමින් එය හැඳින්වෙයි. මග දෙපස මහ වනයෙන් ගැවසි ඇත එම වනපෙදෙස පසුකරමින් කම්බි පාලම වෙත අපි පිවිසයෙමු. පාලම දිගේ පියනගන මට එය විස්මය ජනක වු ත්‍රාසජනක අත්දැකීම් විය.

ඉන්පසු මෙල්බන් පුරවරයේ ඇතිවු ශෝකජනක සිද්ධියක් නැරඹිමටද අපි ගියෙමු. මනහර තුරුලතාවන් වියලි දරකඩක් බවට පෙරලු මිනිස් ජීවිත සියගණන් බිලිගත් වටිනා රථවාහන අළු බවට පත්කල රුදුරු ව්‍යසනය හෙවත් ලැව්ගින්න මෙල්බන් පුරවරයෙහි ඇති වු අභාග්‍ය සම්පන්න සිද්ධියක් බව මට පෙනුණි. එකි නටඹුන් තවමත් එහි දක්නට ඇත.

පසුව අපි ඕස්ට්‍රේලියාවේ රන් ආකාරයක් නැරඹීම සඳහා බැලරාට් නම් පෙදෙසට දීර්ඝ සංචාරයක් යෙදුනෙමු. විශ්මය දනවන එම රන් ආකාරය නැරඹීම සඳහා දෝනාවක් දිගේ ගමන් කල යුතුවිය. කිසි දිනෙක නොගිය නුහුරු නුපුරුදු ගමනක් යෙදුණු අපි එහි පතුල දක්වා ගමන් කිරිමට අපොහෙ-ාසත් විමු. ඉතා විශාල යන්ත්‍රවල ආධාරයෙන් රන් මිශ්‍ර ශෛලමය කැබලි වලින් රත්රන් ලබාගන්නා අයුරුද අපි දුටුම්. වැලිගල් සහිත ජලයෙන් රන් කැබලි වෙන්කර ගැනිම සඳහා ඒවා ගරන අයුරුද අපට දිස්විය. රනින් කල ආභරණයන්ගෙන් පිරිගීය ශාලාවක්ද නැරඹු අපි එහි කෙරෙන රන් ආභාරණ

39 පිටට



# වම් ඉවුරේ මිනිස්සු

### රාජාංගනේ මතක සටහන්

## ගොම්මනේ බැද්දේ රිංගන්ට එපා.. බොටකඳා වෙහෙක්කම...

වම් ඉවුරු ඇලේ දියපහරේ හඬ මට හොඳින් ඇසෙයි. ඒ හඬ අතරින් ඈත වනපෙත දෙසින් ඇසෙන විවිධාකාර සතුන්ගේ හඬ සිතට ඇති කරන්නේ වචන වලට නැගිය නොහැකි සංවේදනයකි.

කොයින් බණ්ඩා මාමා උගුරේ රැල් බුරුල් හැර මා හා කතාවට වැටෙයි. උන්දෑගේ කතා අසා සිටින විට පාලුව මැකෙයි. උන්දෑ දොජමලු වී සිටින්නේ මෙදා සැරේ ගමේ සිට එනන විට මා ගෙන ආ සීල් අරක්කු බෝතලයෙන් මදක් සප්පායම් වී සිටින බැවිනි. ඇඟපත් රත් කර ගන්නට අඩියක් ගැසුවත් උන්දෑ පෙරේත කමට බොන්නෙක් නොවේ.

"කෙල්ල.. මේ මහතැන් ඉන්න ඉසව්වෙම දිය බුං ගහ.. ඇඟට හෙම නොව... මහතැන් වැවට කෝඩුයි.. දිය අහවරින් බැද්දෙ හක්කොලන් නොකර ඉරගල වැටෙන්ට කලින් මේ වර" කොයින් බණ්ඩා මාමා කියන්නේ දෝණියන්දෑටය. ඈ කොයින් මැණිකා ය. ඉර බැහැගන යන විට වැවට බැස දිය නාන්නට මගේ ඇති ආසාව මාමා දනියි. ඔහු සිය දියණිය මා සමග වැවට එවන්නේ මගේ ආරක්ෂාවට ය. මේ පිටිසර ගැමියන්ගේ කරුණාව මගේ සිතේ ඇති කරන්නේ මහත් සතුටකි.

මා හා සම වයසේ පසුවන කොයින් මැණිකා ද පියා කී ලෙසම මා අසළින්ම දිය නාන්නේ මට රැකවරණය සළසන මවක් පරිද්දෙනි.

"මහත්තයා ඈතට නොය.. හදියක් උනොත් අපුච්චා මා කීතු කරයි.. මෙහෙට වෙය.." මා වැවේ මදක් ඈතට යන විට කොයින් මැණිකා කෑ ගසා කියයි. ඔවුන්ගේ බස අමුතුය. උච්ඡාරණය ද අමුතුය. අපූරු ලතාවක් ඒ කතා බහේ ඇත. අව්‍යාජය. මා මේ කතා කරන යුගය වන විට විවෘත ආර්ථික මඩ ගොහොරුවේ ගිලෙමින් තිබූ නාගරික සමාජයේ සංකීර්ණත්වයේ සුළං පොදක් හෝ මේ වම් ඉවුරේ ගම්මාන වලට නොවැදීම කොයි තරම් යහපත් දැයි මට සිතෙයි.

ඔවුන් නා ගන්නා විට හිසේ ගාන්නේ කුඹුක් දලු තලා සාදා ගත් නානුවයි. මදක් නා ගන්නා විට කොයින් මැණිකා මට කතා කරන්-න් මගේ හිසේ මේ නානුව ගාන්නට ය. මා හිස පාත් කළ විට ඇය මවක කුඩා දරුවකු හිස පිරිසිදු කරන්නා සේ මගේ හිසේ කුඹුක් කොළ නානුව ගායි.

"පියවරක් හිට දියේ ගිල.." ඇගේ ගැමි වහරින් ඈ කියන්නේ විනාඩියකට දෙකකට පසු හිස සෝදා ගන්නා ලෙස ය.

දිය නා අවසන් වී නිවසට පැමිණි විගසින් ඇය බෙලිමල්, රණවරා, ඉරමුසු වැනි පානයක් මී පැණි සමගින් මට දෙන්නේ අපමණ ගෞරවයකිනි. ඒ දුෂ්කර ගම්මානයේ හුදකලාව සිටි මට ඇය මවක මෙන් විය.

සමහර විටෙක රැයේ මා තනිව බැහැර යන්නට තනන විට ඈ මට අවවාද කරයි.

"මේක දෙයියන්නෙ රට.. කට වරද්දා ගන්ට එපා.. ගොම්මනේ බැද්දේ රිංගන්ට එපා.. බොටකඳා (අලියා) වෙහෙක්කම... තෝ කොහේ වහං වෙන්ට..? ගෙට වෙලා හිට.."

බෝගල